කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

# ශාස්ත්‍රවේදී පළමුවන වසර පරීක්ෂණය - 2018
# පළමු සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

# ECN 1103 ආර්ථික විද්‍යා මූලධර්ම

**කාලය - පැය දෙකක් (02) පමණයි. පළමු ප්‍රශ්ණය ද ඇතුළුව පළමු හා දෙවන කොටසින් එක් ප්‍රශ්ණයක බැගින් තෝරාගෙන ප්‍රශ්ණ තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් ප්‍රශ්ණ අතරින් ප්‍රශ්ණ **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

අ. ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීමටත් සැපයුම් වක්‍රය ඉහළ අතට ගමන් කිරීමටත් කවර හේතු සාධක බලපා ඇත්දැයි පැහැදිලි කරන්න. එමෙන්ම මෙම වක්‍ර නිර්මාණය කිරීමේ දී කවර උප කල්පනයන්ට එළඹිය යුතු දැයි පෙන්වා දෙන්න. (ලකුණු 10)

ආ. ව්‍යවසායකත්වය හා ශ්‍රමය අතර වෙනස පෙන්වා දෙමින් ව්‍යවසායකත්වයේ සුවිශේෂී කාර්යභාරය කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ඇ. උචිත ඉල්ලුම් සැපයුම් රූපසටහනක් භාවිතා කරමින් පාරිභෝගික භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවූ අවස්ථාවක සිදුවිය හැකි සුබසාධන ප්‍රතිවිපාක විභාග කරන්න. (ලකුණු 10)

ඈ. රටවල් විසින් මුහුණ දෙන සාර්ව ආර්ථික ගැටළු මොනවාදැයි පෙන්නා දෙමින් ඒවා විසඳීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ඉ. ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එය මිණුම් කරන්නේ කෙසේද? විශාල හා කුඩා ආර්ථික අතර වෘද්ධි අනුපාතිකයේ අගය සැසඳීමේදී මුහුණ දීමට සිදුවන මූලික ගැටළු මොනවාද? (ලකුණු 10)

උ. විභව හා සැබෑ නිෂ්පාදන මට්ටම් අතර වෙනස පැහැදිලි කරමින් ව්‍යාපාර චක්‍රයක අඩංගු ප්‍රධාන අදියර හතර තුළ දී සැබෑ නිමැවුම් මට්ටම හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

## පළමු කොටස

පහත සඳහන් ප්‍රශ්ණ අතරින් **ඕනෑම එක්** ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න.

(02) අ. ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත සඳහන් ආකාරයට දී ඇත්නම් වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

QD = 725-2.5P
QS = 100+10P (ලකුණු 5)

ආ. සමතුලිතයේදී ඉල්ලුම හා සැපයුම නම්‍යතාවයන් ගණනය කරමින්, ඒ පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ලකුණු 5)

ඇ. රජය මෙම භාණ්ඩය සම්බන්ධයෙන් රු.60ක අවම මිළ සීමාවන් පැනවූයේ නම් වෙළඳපොළ තුළ වන මිලපෑම ගණනය කරමින් ඒ පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ලකුණු 5)

ඈ. උචිත රූප සටහන් භාවිතා කරමින් "ඉල්ලුමේ වෙනස" හා "ඉල්ලුමේ ප්‍රමාණයේ වෙනස" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඒ සඳහා බලපාන හේතු සාධක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඉ. ආදායම් ඉල්ලුම් නම්‍යතාව සහ හරස්මිල නම්‍යතාව භාවිතා කරමින් කිසියම් භාණ්ඩයක් සාමාන්‍ය භාණ්ඩයක් ද, බාල භාණ්ඩයක් ද, අනුපූරක භාණ්ඩයක් ද නැත්නම් එය ආදේශන භාණ්ඩයක් ද යන්න තීරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

# ශාස්ත්‍රවේදී පළමුවන වසර පරීක්ෂණය - 2018

## පළමු සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

# ECN 1103 ආර්ථික විද්‍යා මූලධර්ම

**කාලය - පැය දෙකක් (02) පමණයි. පළමු ප්‍රශ්ණය ද ඇතුළුව පළමු හා දෙවන කොටසින් එක් ප්‍රශ්ණයක බැගින් තෝරාගෙන ප්‍රශ්ණ තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් ප්‍රශ්ණ අතරින් ප්‍රශ්ණ **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

අ. ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීමටත් සැපයුම් වක්‍රය ඉහළ අතට ගමන් කිරීමටත් කවර හේතු සාධක බලපා ඇත්දැයි පැහැදිලි කරන්න. එමෙන්ම මෙම වක්‍ර නිර්මාණය කිරීමේ දී කවර උප කල්පනයන්ට එළඹිය යුතු දැයි පෙන්වා දෙන්න. (ලකුණු 10)

ආ. ව්‍යවසායකත්වය හා ශ්‍රමය අතර වෙනස පෙන්වා දෙමින් ව්‍යවසායකත්වයේ සුවිශේෂී කාර්යභාරය කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ඇ. උචිත ඉල්ලුම් සැපයුම් රූපසටහනක් භාවිතා කරමින් පාරිභෝගික භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවූ අවස්ථාවක සිදුවිය හැකි සුබසාධන ප්‍රතිවිපාක විභාග කරන්න. (ලකුණු 10)

ඈ. රටවල් විසින් මුහුණ දෙන සාර්ව ආර්ථික ගැටළු මොනවාදැයි පෙන්නා දෙමින් ඒවා විසඳීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ඉ. ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එය මිණුම් කරන්නේ කෙසේද? විශාල හා කුඩා ආර්ථික අතර වෘද්ධි අනුපාතිකයේ අගය සැසඳීමේදී මුහුණ දීමට සිදුවන මූලික ගැටළු මොනවාද? (ලකුණු 10)

උ. විභව හා සැබෑ නිෂ්පාදන මට්ටම් අතර වෙනස පැහැදිලි කරමින් ව්‍යාපාර චක්‍රයක අඩංගු ප්‍රධාන අදිර හතර තුළ දී සැබෑ නිමැවුම් මට්ටම හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

## පළමු කොටස

පහත සඳහන් ප්‍රශ්ණ අතරින් **ඕනෑම එක්** ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න.

(02) අ. ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත සඳහන් ආකාරයට දී ඇත්නම් වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

QD = 725-2.5P
QS = 100+10P (ලකුණු 5)

ආ. සමතුලිතයේදී ඉල්ලුම හා සැපයුම නම්‍යතාවයන් ගණනය කරමින්, ඒ පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ලකුණු 5)

ඇ. රජය මෙම භාණ්ඩය සම්බන්ධයෙන් රු.60ක අවම මිළ සීමාවන් පැනවූයේ නම් වෙළඳපොළ තුළ වන මිලපෑම ගණනය කරමින් ඒ පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ලකුණු 5)

ඈ. උචිත රූප සටහන් භාවිතා කරමින් "ඉල්ලුමේ වෙනස" හා "ඉල්ලුමේ ප්‍රමාණයේ වෙනස" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඒ සඳහා බලපාන හේතු සාධක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඉ. ආදායම් ඉල්ලුම් නම්‍යතාව සහ හරස්මිල නම්‍යතාව භාවිතා කරමින් කිසියම් භාණ්ඩයක් සාමාන්‍ය භාණ්ඩයක් ද, බාල භාණ්ඩයක් ද, අනුපූරක භාණ්ඩයක් ද නැත්නම් එය ආදේශන භාණ්ඩයක් ද යන්න තීරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

(03) අ. පහත සඳහන් පිරිවැය සංකල්ප නිර්වචනය කරන්න.

I. ස්ථාවර පිරිවැය හා චල්‍ය පිරිවැය
II. සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය
III. සාමාන්‍ය පිරිවැය හා ආවස්ථික පිරවැය (ලකුණු 5)

ආ. සාමාන්‍ය පිරිවැය වක්‍රය U හැඩයක් ගැනීම සම්බන්ධයෙන් බලපාන කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඇ. ලාභය උපරිමනය කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරමින් ඒ සඳහා වන කොන්දේසි මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 5)

ඈ. ආයතනයක කෙටිකාලීන හා දිගුකාලීන සමතුලතාව යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 5)

ඉ. "පූර්ණ තරඟකාරී ආයතනයකට කෙටිකාලය තුළ දී අලාභ ලබමින් වුවද නිෂ්පාදන කටයුතුවල නිරතවීමේ හැකියාව ඇත". පැහැදිලි කරන්න. (ලකුණු 5)

(04)

අ. ඒකාධිකාරී තරඟය හා කතිපයාධිකාරී වෙළඳපොල ආකෘතිය අතර වෙනස්කම් ඔබ පැහැදිලි කරන්නේ කෙසේද ? (ලකුණු 5)

ආ. "පූර්ණ තරඟකාරී ආයතනයකට අසාමාන්‍ය ලාභ ඉපයීමක් හෝ අලාභ ලැබීමක් කළ හැක්කේ කෙටිකාලයේ දී පමණි". පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඇ. ඒකාධිකාරීත්ව ආයතනයකට මිළ හෝ නිමැවුම් ප්‍රමාණය තීරණය කිරීම සම්බන්ධයෙන් බලපෑම් කළ හැකි වුවත්, මිළ හා නිමැවුම් ප්‍රමාණය එකවිට තීරණය කළ නොහැකිය. පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඈ. කතිපයාධිකාරී ආයතනයන්හි මිළ වෙනස්කිරීම් ස්ථාවරව පවත්වාගෙන යා හැකි වුවත් වෙනත් වෙළෙඳපොලවල ක්‍රියාකරන ආයතනවලට එසේ කළ නොහැක්කේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඉ. ඒකාධිකාරීත්වයක් පැනනැගිය හැකි ආකාරයන් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

## දෙවන කොටස

පහත සඳහන් ප්‍රශ්ණ අතරින් ඕනෑම **එක් ප්‍රශ්ණයකට** පමණක් පිළිතුරු සපයන්න.

(05)

අ. ආදායම් චක්‍රීය ප්‍රවාහ ආකෘතිය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? අංශ තුනක් සහිත ආකෘතියක් සැලකිල්ලට ගනිමින් එවනි ආකෘතියක ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 7)

ආ. ජාතික ආදායම ඇස්තමේන්තු කළ හැකි ප්‍රධාන ප්‍රවිශ්ඨයන් තුන කෙටියෙන් සාකච්ඡා කරමින්, එම ප්‍රවිශ්ඨයන් තුන මඟින් එකිනෙකට සමාන ප්‍රතිඵල ලැබෙන බව පෙන්නුම් කරන්න. (ලකුණු 6)

ඇ. සියළුම නිෂ්පාදන ආයතනවල නිමැවුම් මට්ටම් එකට එකතු කිරීම මඟින් ජාතික නිමැවුමේ වටිනාකම තක්සේරු කළ නොහැකි යැයි පවසන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඈ. කාන්දුවීම් හා විදීම් යනුවෙන් අදහස් වනනේ කුමක්ද? කාන්දුවීම් හා විදීම් ආදායම් චක්‍රීය ප්‍රවාහයේ ප්‍රමාණයට හා ආර්ථිකයේ පැහැදම කෙරේ කෙසේ බලපෑම් කරන්නේ ද? (ලකුණු 7)

(6)

අ. ජාතික නිෂ්පාදනයේ වටිනාකම සාධක මිළ අනුව මිස වෙළෙඳ මිළ අනුව තක්සේරු නොකරන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 3)

ආ. දළ දේශීය නිෂ්පාදනය හා දළ ජාතික නිෂ්පාදනය අතර වෙනස කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු 3)

ඇ. දළ හා ශුද්ධ ජාතික නිෂ්පාදිතයන් අතර ඇති වෙනස කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු 3)

ඈ. ද්විගණන හා බහුගණන දෝෂ ඉවත් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

ඉ. දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා තුළ පැවතිය හැකි මිණුම් කිරීමේ දෝෂ මොනවාද? (ලකුණු 6)

ඊ. ජාතික ගිණුම් සංඛ්‍යාවල භාවිතයන් හා දුර්වලතාවන් මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 6)

(07)

පරිභෝජන ශ්‍රිතය $C = 110 + 0.7\,Y$ මගින් ද, ආයෝජන $(I) = 50$, රජයේ මිළට ගැනීම් $(G) = 200$, අපනයන $(X) = 100$ සහ ආනයන $(M) = 110$ ලෙස ලබා දී ඇතැයි සිතන්න.

අ) මෙම ආර්ථිකයේ සමතුලිතතා මට්ටම කුමක්ද? (ලකුණු 6)

ආ) සමතුලිතයේ දී ඉතුරුම් කීය ද? (ලකුණු 5)

ඇ) ගුණකයෙහි වටිනාකම කුමක් ද? (ලකුණු 4)

ඈ) සමතුලිතතාව දක්වන රූප සටහනක් ඇඳ පෙන්වන්න. (ලකුණු 5)

ඇ) $S = I$ කොන්දේසිය ඉටුවන පරිදි ආර්ථිකයේ සමතුලිතතා මට්ටම ලබාගන්න. (ලකුණු 5)

(08)

අ. කෙටිකාලීන හා දිගුකාලීන සමහරක සැපයුම් වක්‍රයන් අතර වෙනස පෙන්වා දෙමින් ඒවා එවැනි හැඩයක් ගැනීම සම්බන්ධයෙන් බලපාන සාධක මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

ආ. නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක්ද? සාම්‍ය නිමවුම් නිෂ්පාදිත ශ්‍රිතයක අන්තර්ගත කොටස් (සංරචක) මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)

ඇ. මුළු සාධක ඵලදායිතාව යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? එය මිණුම් කරන්නේ කෙසේද? (ලකුණු 5)

ඉ. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය යනුවෙන් අදහස වන්නේ කුමක් ද? එය කෙසේ මිණුම් කළ හැකි ද? (ලකුණු 5)

ඊ. මුදල් වෙළෙඳපොල හා ණය අරමුදල් වෙළෙඳපොල තුළ පොලී අනුපාතිකයේ කාර්යභාරය කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 5)